

# පමා නොවී ඒ අකුරට

රසික සූරියආරච්චි ලියයි

## අම්මා ඇඬූ ද

මගේ ලියන මේසය මත ඇති චිමිනි ලාම්පුවේ දීප්තිමත් එළියෙන් අපේ කුඩා කාමරය ආලෝකමත් වී ඇත. ඔහු ගේ මේසය මත ඇති චිමිනි ලාම්පුව නිවා දමා මල්ලී නින්දට ගියේ දැන් මද වේලාවකට කලිනි. මල්ලීටත් මටත් දෙදෙනාටම නිදගැනීමට ඇති කුඩා ඇඳේ ඔහුගේ කොටසට ගුලි වී ඔහු මේ වන විටත් හොඳ නින්දේ ය.

වේලාව රාත්‍රී දහය ද පන්නා ඇති බව අපේ එලාම් ඔරලෝසුව කියයි. මට නිදිමතක් දැනේ. මම මා කියවමින් සිටි කාබනික රසායනය සටහනෙන් හිස ඔසවා ඈනුමක් යවමි. ඈනුම අවසානයේ මගේ නෙත් විවර වෙනවාත් සමගම මා දකින්නේ හාෆ් ෂීට් කඩදාසියක ලියා, කාඩ්බෝඩ් පුවරුවක අලවා සකසා මේසය උඩ තබා ඇති පුවරුවකි. බැලූ බැල්මට එහි පෙනෙන්නේ එක් විශාල අකුරකි. ඒ අන් කිසිවක් නොව ඉංගිරිසි අකාරාදියේ මුල් අකුරයි. උසස් පෙල හදරන සිසුන් ගේ සිත් සතන් තුල පැල පදියම් වූ පරමාදර්ශී ශුද්ධ වූ කුසලානයි. ආණ්ඩුවේ විභාගයෙන් ලබාගත හැකි විශිෂ්ඨතම සාමාර්ථය නිරූපනය කෙරෙන "ඒ" අකුරයි! "ඒ" අකුරට අමතරව එම පුවරුවේ ඉංගිරිසියෙන් ලියූ කෙටි වැකි කිහිපයක් වේ. මට "ඒ" සාමාර්ථ හතරක් ගැනීමට අවශ්‍යය!

මා "ඒ" සාමාර්ථ හතරක් ගත යුතුමය!! ඔව්, මම "ඒ" සාමාර්ථ හතරක් අනිවාර්යයෙන් ම ගනිමි!!!

මේ පුවරුව දකින මගේ නිදිමත නැති වී යයි. මරදන බලා යන දුම්රියකට ගොඩ වීමට දුම්රිය පොලට යාම සඳහා හරියට පහයි හතලිස් පහට අප නිවස පසු කරන බසය අල්ලා ගැනීමට උදෑසන පහට පමණ අවදි විය යුතු බව මට අමතක වී යයි.

"ඒ" හතරක් ගැනීම යනු, සාපේක්ෂව හොඳින් ජීර්ණය වන විෂයයන් වන ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව සහ ශුද්ධ ගණිතයට පමණක් නොව තරාදියේ අනෙත් පස ඇති රසායන විද්‍යාවට ද විශිෂ්ඨ සාමාර්ථයක් ගැනීමයි. මම නැවතත් රසායන විද්‍යා සටහනේ ඇති "ටොලුයීන්" නම් වූ සංයුක්තය "මීතයිල් සැලිසිලෙට්" බවට පරිවර්තනය කිරීම සඳහා ඇති ක්‍රමවේදය දෙස සිත යොමු කරමි.

ලංකාවේ අධ්‍යාපන ක්‍රමය කවදත් සැකසී ඇත්තේ මනාව සකසා ඉදිරිපත් කර ඇති තිර රචනයන් කිහිපයක් ද සමගිනි. පහේ පන්තියේ විභාගය සමත් වූයේ නම් ගමේ පාසලේ සිට අසල නගරයේ පාසලට යා යුතුය. ඉන් පසු ඇති සාමාන්‍ය පෙල වැනි විභාගයක් ඉහලින් සමත් වූයේ නම් ඊටත් වඩා හොඳ, ඇතැම් විට අගනුවර හෝ ප්‍රධාන නගරයක ඇති ජාතික මට්ටමේ පාසලකට යා යුතුය. සාමාන්‍ය පෙල හොඳින් සමත් නම් උසස් පෙල සඳහා විද්‍යාව හැදෑරිය යුතුය. එහිදීත් ගණිතය සඳහා දස්කම් දක්වන්නන් භෞතික විද්‍යා විෂයය ධාරාව තෝරා ගත යුතුය. විද්‍යාව සඳහා දස්කම් ඇත්තන් ජීව විද්‍යාව විෂයය ධාරාව තෝරා ගත යුතුය. එතැනින් ඔබ යා යුත්තේ එක්කෝ ඉංජිනේරු පීඨයට ය. නැතිනම් වෛද්‍ය පීඨයට ය. ධාවන පථ ඉතා සරල ය. අපට ඇත්තේ පිටපත අනුගමනය කිරීම පමණි.

එක් කුඩා ප්‍රශ්ණයකට තිබුනේ, පිටපතේ විදියට රඟපා අපේක්ෂිත පරිදි ඉංජිනේරු පීඨයට හෝ වෛද්‍ය පීඨයට හෝ යෑමට නම් උසස් පෙල විභාගය ඉතා ඉහලින් ම සමත් වීමට සිදුවීමය. එය තිර රචනයේ කියවද්දී නම් ඉතා ලෙහෙසි දෙයක් ලෙස පෙනෙන නමුත් ප්‍රායෝගිකව ඉතා අසීරු කර්තව්‍යයක් බව අමුතුවෙන් කිව යුතු නැත.

මේ අසීරු ඉලක්කය කරා හඹා යන ගමන ආරම්භ වීමත් සමගම පාහේ ඒ සඳහා මගේ උනන්දුව සැමද නො අඩුව තබා ගැනීමට මා මෙහිදී අනුගමණය කලේ ඉතා සරල අභිප්‍රේරණ විධික්‍රමයකි. එය නම්, උසස් පෙල විභාගයෙන් ලැබිය හැකි හොඳම ප්‍රථිපලය හෙවත් විශිෂ්ඨ සම්මාන හතරක්, "ඒ" හතරක්, ගැනීමට සැලසුම් කිරීමයි. එම සැලැස්ම නිතර දෙවේලේ, මවිසින්, මට ම, සිහිපත් කරවා ගැනීමයි.

මට්ටකුණ්ඩලී ගේ පියා පිලිස්සූ කරවල කැබැල්ලක් තම නැහැය ඉදිරියේ තබා ඒ සුවඳ විඳිමින් අමු අමුවේ බත් කෑ බව කියවේ. නීරස වූ රසායන විද්‍යා පාඩම් රසවත් සේ ගිල දැමීමට මෙන්ම, අන්තර්ගතය එතරම් ප්‍රශ්නයක් නොවූ නමුත් කාලය පිළිබඳව සැමවිටම අභියෝග මැවූ, භෞතික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය සහ ශුද්ධ ගණිතය විෂයයන් ගේ අත ගැසෙන මානයේ වූ සියළුම උදාහරණ, ගැටළු, පසුගිය විභාග ප්‍රශ්ණ සහ අභියෝග හැදෑරීමට ද මට උපකාරීවූයේ පෙර විස්තර කෙරුණු පරිදි අපේ කාමරයේ මගේ ලියන මේසය ඉදිරියේ පුටුවේ මා අසුන් ගත් කළ, මූණට පොල්ලෙන් ගැසුවාක් සේ නොවැරදී පෙනෙන්නට තබා තිබුණු "ඒ" අකුරේ සටහනය.

මේ පුවරුව මගේ මවගේ දැඩි ඇගයුමටද, සොහොයුරන් ගේ සරදමටද ලක්වූ බව කිව යුතුය. කෙසේ වුවද, අගෝස්තු මස පැවති උසස් පෙල විභාගයේ අවසානයත් සමගම මට වැටහුනේ, මගේ උත්සාහය මුළුමනින්ම නිෂ්ඵල නොවී, "ඒ" හතරක් කෙසේ වෙතත්, යාන්තමින් හෝ "ඒ" සාමාර්ථ තුනක් සහ "බී" සාමාර්ථයක් ලබාගන්නට මට ඉඩ කඩ ඇති බවකි.

රජයේ අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් වීමත් සමගම විභාග පටිපාටියද වෙනස් වෙමින් පැවතුනු නිසා අපේ සුවිශේෂී උසස් පෙල විෂයය නිර්දේශය සඳහා වූ ඊලඟ වසරේ විභාගය නියමිත වූයේ අප්‍රියෙල් මාසයටය. ඒ සඳහා මුදල් ගෙවා අයැදුම් කරන්නට දිනය අත ලඟටම පැමිණියේ වුවද, අගෝස්තු වේ පැවැත්වූ අපේ විභාගයේ ප්‍රතිඵලය නම් නිකුත් කරන සේයාවකුදු නොවීය. සිදුවෙමින් පැවතියේ මහා අසාධාරණයකි. එහෙත්, ශ්‍රී ලංකාව වැනි රටක මේ ගැන කාට නම් පැමිණිලි කරන්නද? කණගාටුවෙන් මෙන් මා ඇතුළු, පෙර ලියු පිටපතට අනුව ඉංජිනේරු, වෛද්‍ය පීඨයන් ට යාමට සැරසී සිටි, එනමුත් තම විභාග ප්‍රතිඵල පිලිබඳ සියයට සීයක ස්ථිරත්වයක් නැති මා වැනි බොහෝ දෙනෙකුට සිදුවූයේ නැවතත් විභාගයට පෙනී සිටීමට අයැදුම් කිරීමටයි.

අවසානයේ විභාග ප්‍රතිඵල නිකුත් විය. මා එද පාසලේ සිට නිවස බලා ආයේ කැළඹුණු සිතින් ද දැවෙන හදවතින් ද යුතුව බව කිව යුතුය. මා ගෙට ගොඩවත්ම අම්මා හා තාත්තා මා ඉදිරියට පැමිණියහ.

"කොහොමද? මොනවද ප්‍රතිඵල?" අම්මා ගේ දෑස් දැඩි උනන්දුව නිසාම ප්‍රභාමත් වී ඇති අයුරු මම දිටිමි.

"බී දෙකයි, සී දෙකයි" බිඳුණු හඬින් මා පැවසූයේ අම්මා හෝ තාත්තා හෝ දෙස නොබලා ම ය. තාත්තා නිසොල්මන්ව බලා සිටියේය. අම්මා ගේ මුහුනේ ඇඳී ගියේ අමුතුම ආකාරයක හිනාවකි.



"ඔයා ඔය බොරු නේද කියන්නේ? ඇත්ත කියන්න-කෝ ළමයෝ විහිළු නොකර?"

"බොරු නෙමේ අම්මේ මේ ඇත්ත තමයි. බී දෙකයි, සී දෙකයි මට ඇවිත් තියෙන්නේ."
අම්මා ගේ කඳුලින් පිරුණු දෙනෙත දුටු මට ඇතිවූයේ බලවත් සංකාවකි.
"කමක් නෑ අම්මේ, මං මේ අප්‍රියෙල් වල ආපහු විභාගේ කරනවා, කොහොමටත් ඇප්ලිකේෂනුත් දීල නේ තියෙන්නේ" මම අමාරුවෙන් වචන ගලපා ගතිමි.

"උඹ ආයේ විභාගේ කරපන්. මං සල්ලි දෙන්නම් අමතර පන්තිවලට යන්න" තාත්තා සුපුරුදු එඩිතර හඬින් පැවසීය.

කාමරයට ගිය මම ඇඳ මත දිගාවී මගේ ලියන මේසය දෙස බැලුවෙමි.
"ඒ" අකුර සහිත පුවරුව මගේ දෙනෙතට අසුවිය. කෙමෙන් තෙත් වී ගෙන ගිය මගේ දෑසෙන් ඒ රුව බොඳවී යන්නට ගතවූයේ තත්පර කිහිපයක් පමණි.

### පසු සටහන:

මේ කතාවේ සැබෑ අවසානය මෙතරම් දුක්බර එකක් නොවේ. මෙහි දෙවන කොටස "අම්මා සිනාසුනාය" ලබන මාසයේ බලාපොරොත්තුවන්න.


MATHEMATICS TUTORING

Maths Methods(CAS) 3&4

Specialist Mathematics

Maths Methods(CAS) 1&2

General Maths Advance

Mathematics Year 7-10

by Madira Ginnige
Experienced Current Secondary School Mathematics Teacher

Attending my small group tuition class will
- Increase confidence, Grades, motivation and self-esteem.
- Gain the ability to manage study time efficiently.
- Ability to manage time efficiently during exam periods.
- Provide opportunity to work through highly relevant, current Trial Sac & Examination questions.

To book/register, contact
03-98071577 or SMS 0432972667
or send an e-mail to:
madiraginige1@yahoo.com

*Individual lessons available on request

Venue: 1/17 Mummery Street, Mount Waverley 3149


පිවිසෙන්න www.sannasa.net